# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023

2025 අගෝස්තු

**මානවශාස්ත්‍ර පීඨය**

**සාහිත්‍ය විචාරය (නව නිර්දේශය)**

**ග්‍රීක රෝම යුගයන්හි සාහිත්‍ය නිර්මාණ හා සෞන්දර්ය සංකල්ප අධ්‍යයනය**

**LTCR 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ග්‍රීක ශිෂ්ටාචාරයෙහි අනන්‍යතාව නිර්මාණයෙහි ලා, ග්‍රීක භූගෝලීය හා සමාජ දේශපාලන පසුබිම නිශ්චිතව ම බලපෑවේය." මෙහි සත්‍යාසත්‍යතාව සනිදර්ශනව පරීක්ෂා කරන්න.

02. "ඉලියඩ් හි වීරයා ඇකිලීස් වුවද ට්‍රෝයි පුරවරයෙහි වීරයා හෙක්ටර්ය." හෙක්ටර්ට අනන්‍ය වීරත්වය, පවුල හා දේශපාලනය වෙතින් පිළිබිඹු වූ ආකාරය සනිදර්ශනව විභාග කරන්න.

03. ග්‍රීක නාට්‍යකලාවෙහි ප්‍රභවය අරභයා පැනනැගී ඇති මතවාද කෙබඳු දැ යි පරීක්ෂා කරන්න.

04. ෆිලොක්ටිටිස් නාට්‍යයේ කතා පුවත සාරාංශ කොට එක් චරිතයක් පිළිබඳ විග්‍රහයක් සපයන්න.

05. සොක්‍රටීස්ගේ අදහස් කෙරෙහි විශේෂාවධානය යොමු කරමින් ග්‍රීක දාර්ශනික සංවාදය විමසන්න.

06. සාහිත්‍යකරණයෙහි ලා අනුකරණය පිළිබඳ දැක්වෙන ඇරිස්ටෝටලියානු සිද්ධාන්තය අරභයා විමර්ශනයක යෙදෙන්න.

07. ප්ලෝටස් විසින් රචිත කඹය (Rudens) නාට්‍යයෙහි දී යහපත් පුරුෂාර්ථ ස්ථාපිත කරනු වස් දේවචරිත උපකාරී කරගත් ආකාරය සනිදර්ශන ව විමර්ශනය කරන්න.

08. කවියා හා කාව්‍ය රචනය අරභයා රෝමවරුන් දැරූ ආකල්ප කවරේ දැයි පරීක්ෂා කරන්න.

09. "කාව්‍ය නිර්මාණකරණය පිළිබඳ ව හොරස් විසින් ප්‍රකාශිත සංකල්ප කාල දේශ සීමා අතික්‍රමණය කරමින් සර්වකාලීන අගයකින් යුතු වන්නේය." මෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

10. භාෂාත්මක උත්කෘෂ්ටතාව කරා ළඟාවීමට නිර්මාණ සාහිත්‍යාංගයක පැවතිය යුතු ලක්ෂණ අරභයා ලොංජයිනස් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ කවරේ දැ යි පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

********************************